**ශීර්ෂය 106 - ආපදා කළමනාකරණ අමාත්‍යාංශය**

**------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ විගණන මතය**

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) ආදායම් නොවන ලැබීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුල අමාත්‍යාංශයේ ආදායම් සංකේත 04 ක් යටතේ රු.186,433,631 ක ආදායම් රැස්කර තිබුණි. නමුත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී ආදායම් ගණන්දීමේ නිලධාරියෙකු වශයෙන් නම් කර නොතිබුණු බැවින් එකතු කරන ලද ආදායම, ආදායම් නොවන ලැබීම් යටතේ දක්වනු වෙනුවට ආදායම් ලැබීම් වශයෙන් දක්වා තිබුණි. | ආදායම් ගණන්දීමේ නිලධාරියෙකු නොවන බැවින් ආදායම් නොවන ලැබීම් යටතේ ආදායම් ගිණුම් ගත කළ යුතුය. | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි ආදායම් ගණන්දීමේ නිලධාරියෙකු නොවුනද අමාත්‍යාංශය විසින් ආදායම් සංකේතාංක 4 ක් යටතේ ආදායම් රැස් කර භාණ්ඩාගාරය වෙත වාර්තා කර තිබුණු අතර වැරදීමකින් මෙය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම් ලැබීම් යටතේ දක්වා ඇත.කෙසේ වුවද ඉදිරියේදී මෙම රැස් කරන ආදායම්, ආදායම් නොවන ලැබීම් යටතේ දැක්වීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | මූල්‍ය ප්‍රකාශන සමග ආදායම් ගිණුමක් ඉදිරිපත් කර තිබුණද ප්‍රධාන ගණන්දීමේ නිලධාරී ආදායම් ගණන්දීමේ නිලධාරියාද වශයෙන් නම් කර නොතිබුණු බැවින් එවැනි ගිණුමක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොවීය. | ආදායම් ගිණුමක් ඉදිරිපත් කිරීමෙන් වැලකිය යුතුය. | අදහස් දක්වා නොමැත. |

#### (ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවය හැර ගිය නිලධාරියෙකුගෙන් හා විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් වර්ෂයකට වැඩි කාලයක සිට අය විය යුතු පිළිවෙලින් රු.120,023 ක් හා රු.273,045 ක් වූ ණය ශේෂ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | සේවය හැර ගිය නිලධාරියෙකුගේ ණය ශේෂය වූ රු.120,023 ක මුදල අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ ණය ශේෂය රු 155,493 ක් මේ වන විට නිරවුල් කිරීමට කටයුතු කර ඇත.<br>විශ්‍රාම ගිය අනෙක් නිලධාරියා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වගන්තිය යටතේ විශ්‍රාම යවා ඇති බැවින් රු.117,552 ක් වූ ණය මුදල, ඔහුට |

විරුද්ධව ඇති නඩුවේ තීන්දුව ලැබුණු පසු නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ඇ) අග්‍රිම ශේෂය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මාසික ගිණුම් සාරාංශ අනුව භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු. 1,412,400,000 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අනුව එය රු.1,327,400,000 ක් ලෙස දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මාසයේ මාසික ගිණුම් සාරාංශයේ වූ රු.85,000,000 ක් වූ ප්‍රේෂණ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ප්‍රේෂණ යටතේ සඳහන් නොකර අග්‍රිම අගයෙන් අඩුකර දක්වා තිබීම හේතුවෙන් මෙම වෙනස ඇති වී තිබුණි. | භාණ්ඩාගාර අග්‍රිම නිවැරදිව දැක්විය යුතු වේ. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කර ඇති ආකෘතිය අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ප්‍රේෂණ දැක්වීම සඳහා උප මාතෘකාවක් නැති බැවින් භාණ්ඩාගාරයට ආපසු යවන ලද මුදල්, අග්‍රිම ලැබීම් වලින් අඩු කර පෙන්වන ලදි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මනා අධ්‍යානයකින් තොරව ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් වැය විෂයයන් 13 කට අදාල එකතුව රු. 523,173,407 ක් වූ ප්‍රතිපාදන සියයට 40 සිට සියයට 94 දක්වා පරාසයක් තුළ ඉතිරිවී තිබුණි. | ප්‍රතිපාදන විචක්ෂණව උපයෝජනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ | සියයට 40 ඉක්මවූ ඉතිරියක් පැවති විෂයයන් 13 හි ඉතිරිය රු. 523,173,407 කි. |
| (ආ) මනා අධ්‍යානයකින් තොරව ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් ඇස්තමේන්තු වටිනාකමින් සියයට 35 සිට සියයට 325 දක්වා පරාසයක් තුළ ප්‍රතිපාදන වැය විෂයයන් අතර මාරු කර තිබුණි. | ඇස්තමේන්තු නිවැරදිව සැකසීමට අවශ්‍ය පියවර ගත යුතුය. | ඉදිරියේදී ඇතිවිය හැකි වියදම් අපේක්ෂාවෙන් ඇස්තමේන්තු සකස් කරන නමුත් ප්‍රායෝගික තත්ත්වයන් මත අපේක්ෂිත වියදම් පැන නොනැගීම හා මෙම අමාත්‍යාංශයට අදාළ කාර්යභාරය හා එකී කාර්යභාරය තුලින් පැන නගින්නා වූ අවශ්‍යතාවයන් මත භාණ්ඩාගාරයේ විධිමත් අනුමැතිය ඇතිව මෙම ප්‍රතිපාදන මාරු කිරීම |

සිදු කර ඇත.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ රක්ෂණ ප්‍රතිලාභ ලබා දීම සඳහා ආපදා හානි සම්බන්ධ තක්සේරු වාර්තා හා අනෙකුත් සියලු විස්තර ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් මගින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ඉදිරිපත් කිරීම වෙනුවට අදාළ තක්සේරු වාර්තා හා අනෙකුත් සියලු විස්තර අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ඍජුව ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යැවිය යුතු බවත් එම තොරතුරු පදනම් කරගෙන ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අදාළ රක්ෂණ ප්‍රතිලාභ නිදහස් කිරීම සිදුකළ යුතු බවටත් 2017 ජූලි 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2016(11) මගින් උපදෙස් දී තිබුණි. මේ හේතුවෙන් ස්වභාවික ආපදා වෙනුවෙන් වන්දි ගෙවීම සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ විෂය පථය සීමාවී තිබුණි. | මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශයේ කාර්යභාර්ය නිශ්චය කර ගත යුතු අතර ඒ පිළිබඳ පාලන පද්ධතිය විධිමත් කිරීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

### 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුලදී අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදනය කර තිබුණු ජල ටැංකි, ජල පොම්ප සහ තාපෝලීන් ෂීට් යනාදීයේ ලංසු කැඳවීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂණ වලදී ජාතික තරඟකාරී පදනම මත ලංසු කැඳවා නොතිබීම, කාර්යසාධන සුරක්ෂණයක් ලබා නොගෙන කොන්ත්‍රාත් පිරිනැමීම සහ තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තා ප්‍රමාදවීම හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වී තිබීම වැනි පොදු අඩුපාඩු නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසියාකාරව අනුගමනය කළ යුතුය. | 2018 වර්ෂයේ මුල් මාසවල ඇති වූ ආපදා තත්ත්වය හේතුවෙන් මෙම ප්‍රසම්පාදන සැලැස්ම අනුව නියම කාලවකවානු වලදී ආරම්භ කිරීමට නොහැකි විය. ගංවතුර ආපදා තත්වයෙන් පසුව එම පවුල්වල පානීය ජලය ලබාගන්නා ළිං පිරිසිදු කිරීමේ කාර්යය ශ්‍රී ලංකා යුධ හමුදාවේ හා නාවික හමුදාවේ නිලධාරීන් විසින් සිදු කරන ලදී. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දින වන විට | | |

| | | | |
|---|---|---|---|
| | ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත සපයා නොතිබුණු ජල පොම්ප 175 ක් වෙනුවෙන් සහ තාපෝලීන් ෂීට් 2500 ක් වෙනුවෙන් ගෙවීම සඳහා සැපයුම්කරුවන් වෙත ලියන ලද පිළිවෙලින් රු.21,439,737 ක් සහ රු.24,987,000 ක් වූ චෙක්පත් අත රඳවාගෙන තිබුණි. | | 2019 වර්ෂය සඳහා අතුරු සම්මත ගිණුමකින් ප්‍රතිපාදන සීමාවීම පිළිබඳ පූර්ව දැනුවත්වීමක් සිදු වී තිබුණු බැවින් මෙම භාණ්ඩ සඳහා ඇණවුම් ලබා දුන් අතර භාණ්ඩ ලැබීමේ ප්‍රමාදයක් නිසා චෙක්පත් භාරනොදී රඳවා ගත් නමුත් සියලුම භාණ්ඩ ලැබීමෙන් පසුව චෙක්පත් නිදහස් කරන ලදී. |
| (ඇ) | ලීටර් 1000 ජලටැංකි මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තිය පරිදි ජාතික තරඟකාරී පදනම මත ලංසු කැඳවීම සිදුකර නොතිබුණි. | නියගයෙන් සිදුවන ආපදාවන් සම්බන්ධයෙන් කල්තබා සූදානම් වීමෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගතව ප්‍රසම්පාදන සිදුකළ හැක. | වෙළඳපළේ ජල ටැංකි සැපයීම සඳහා සීමිත සැපයුම්කරුවන් ප්‍රමාණයක් සිටීමත්, එවකට පැවති දැඩි නියඟය හේතුවෙන් කඩිනමින් ජල ටැංකි මිලදී ගෙන ලබා දෙන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ඉල්ලා සිටීමත් නිසා වෙළඳපලේ සිටින සැපයුම්කරුවන් 7 දෙනෙකු වෙතින් සීමිත තරඟකාරී ලංසු පදනම මත මිල ගණන් කැඳවීම සිදු කර ඇත. |

### 3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ක 2017 වර්ෂය තුල සිදුවූ ගංවතුර, නායයාම සහ නායයෑමේ අධි අවදානම් හේතුවෙන් ඉවත් කිරීමට හඳුනාගෙන තිබූ පවුල් 1,444 අතරින් පවුල් 699 ක් නැවත පදිංචි කිරීම සඳහා 2017 හා 2018 වර්ෂවල රු. මිලියන 624.39 මුදලක් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වලින් කළුතර දිස්ත්‍රික් ලේකම් විසින් උපයෝජනය කර තිබුණි. අමාත්‍යාංශය විසින් නිකුත්කර තිබූ මාර්ගෝපදේශයට අනුව නැවත පදිංචිකිරීමේ ප්‍රතිලාභීන්, තෝරාගෙන ලියාපදිංචිකර තිබූ නමුත් ඔවුන්ට නැවත පදිංචි කිරීමේ විකල්ප අවස්ථා තෝරා ගැනීමට නිශ්චිත කාලයක් ලබාදී නොතිබුණි. අදාල ප්‍රතිලාභී ලැයිස්තුව දින 07 ක කාලයක් මහජනතාව සඳහා ප්‍රදර්ශනය කළයුතු වුවත් එවැනි මහජන ප්‍රදර්ශනයක් කළ බවට සාක්ෂි | නායයෑම් සහ නාය යෑම් අධි අවදානම් හේතුවෙන් ඉවත්කිරීමට හඳුනාගත් පවුල් ඉවත්කිරීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමට හා ප්‍රතිපාදන අදාල කාර්යය සඳහා උපයෝජනය කළ යුතු වීම | නායයෑම් අධි අවදානම් කලාප වල ජීවත් වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා නායයෑම් අවදානම් රහිත පදිංචියට සුදුසු ඉඩම් එම දිස්ත්‍රික්ක වලින් සොයා ගැනීම අමතර කාර්යයක් විය. තවද නායයෑම් අවදානමට මුහුණපා තිබුණු ඉඩම් වලින් ජනතාව ඉවත් කර ගැනීමට පොලඹවා ගැනීම හා තෝරාගත් ඉඩම්වල නැවත පදිංචි කරවීම අභියෝගාත්මක ඉලක්ක විය. රජය විසින් ලබාදුන් ප්‍රතිලාභ උපයෝජනය සම්බන්ධයෙන් පසු විපරමක් සිදු |

| | | |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් නොවුණි. රජයේ ඉඩමක, ප්‍රතිලාභීන් සතු ඉඩමක සහ රජයේ මූල්‍යාධාර මත ප්‍රතිලාභීන් මිලට ගත් ඉඩමක රජයේ මූල්‍යාධාර වලින් ඉදිකිරීමට ලබාදුන් රු. මිලියන 121.20 අතරින් රු. මිලියන 33.40 ක් වැයකර ඉදිකිරීම් ආරම්භකර තිබුණු නිවාස 167 ක් 2018 දෙසැම්බර් 31 දින වන විට අත්තිවාරමට පමණක් සීමාවී තිබුණි. | | කිරීමට ප්‍රායෝගිකව දුෂ්කරතා පැවතුණි. |
| (ආ) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අවදානම් සහිත ප්‍රදේශවල ජීවත්වන පවුල් 312 ක් හඳුනාගෙන තිබුණු නමුත් නිවාස තැනීම ආරම්භකර තිබුනේ ප්‍රතිලාභීන් 150 දෙනෙකු සඳහා පමණි. ප්‍රතිලාභීන් 97 දෙනෙකු නැවත පදිංචි කිරිම සඳහා ඉඩම් 02 ක් හඳුනාගෙන තිබුණු අතර විගණිත දිනය වූ 2019 මාර්තු 28 දින වන විටත් එම කටයුතු අවසන් වී නොතිබුණි. අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැවත පදිංචි කිරිම සඳහා පවුල් 264 ක් හඳුනාගෙන තිබුනු නමුත් 2018 දෙසැම්බර් 31 වන විට ඉඩම් හඳුනාගෙන නිවාස ඉදිකිරිම ආරම්භ කර තිබුණේ පවුල් 151 ක් සඳහා පමණි. විගණිත දිනය වූ 2019 අප්‍රේල් 02 දින වන විට ඉතිරි පවුල් 113 සඳහා ඉඩම් හඳුනා ගැනීම පමණක් සිදු කර තිබුණි. | අවදානම් සහිත ප්‍රදේශවල ජනතාව සඳහා කඩිනමින් පහසුකම් සැලසීම සඳහා විධිමත් වැඩපිළිවෙලක අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ මත මහනුවර දිස්ත්‍රික්කයේ අධි අවදානම් කලාපවල ජීවත්වන වතු පවුල් හා වතු නොවන පවුල් 2,098 ක් හඳුනාගෙන තිබුණි. එම පවුල් අතරින් ස්ථිර නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගත් පවුල් 328 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල අමාත්‍යාංශය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් වෙත රු.මිලියන 93.30 ක ප්‍රතිපාදන ප්‍රේෂණය කර තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 50.80 ක ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත ආපසු ප්‍රේෂණය කර තිබුණි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්තාවට අනුව දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල අධි අවදානම් සහිත වතු නොවන නිවාස 24 ක හා වතු නිවාස 25 ක ජීවත්වන පවුල් නැවත පදිංචි කිරීමට යෝජිත වුවත් 2019 මාර්තු 22 වන විටත් අධි අවදානම් කලාපවලින් ඉවත් කර කිසිදු පවුලක් නැවත පදිංචි කර නොතිබුණි. මේ සඳහා 2016 වර්ෂයේදී හඳුනාගත් ලෝරාවත්ත නැමැති රජයේ ඉඩමෙහි පුද්ගලයින් නැවත පදිංචි කිරීමට යෝග්‍ය බව පිළිබඳව ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් පරස්පර නිර්දේශයන් ලබා දීම හේතු වී තිබුණි. ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල 2016 වර්ෂයේ කුරුඳුවත්ත ප්‍රදේශයේ ඇති වූ නායයෑම් තත්ත්වයන් හේතුවෙන් අධි අවදානම් කලාප ලෙස හඳුනාගත් බෙරවිල ප්‍රදේශයේ පවුල් 162 ක් පදිංචි | අවදානම් සහිත ප්‍රදේශවල ජනතාව සඳහා කඩිනමින් පහසුකම් සැලසීම සඳහා විධිමත් වැඩපිළිවෙලක අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබේ. | අදහස් දක්වා නොමැත. |

| | | |
|---|---|---|
| කරවීම සඳහා කුරුඳුවත්ත නගරයට ආසන්න අක්කර 25 ක පෞද්ගලික ඉඩමක් තෝරාගෙන නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා රු. මිලියන 35.40 ක ප්‍රතිපාදන මහනුවර දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබුණි. ඒ අනුව නිවාස ඉදි කර ගැනීම සඳහා පවුල් 153 ක් සඳහා 2018 නොවැම්බර් 16 දින රු. මිලියන 30.60 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් 2019 අප්‍රේල් 08 දින වන විට ඉන් පවුල් 125 ක් කිසිදු නිවාස ඉදි කිරීමක් නොකර අධි අවදානම් කලාප වලම සිටි බව නිරීක්ෂණය විය. උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නායයෑම් අධි අවධානම් කලාපවල ජීවත් වන වතු පවුල් 99 ක් හා වතු නොවන පවුල් 13 ක් හඳුනාගෙන තිබුණ අතර නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා රු. මිලියන 30.80 ප්‍රතිපාදනය මහනුවර දිස්ත්‍රික් ලේකම් වෙත ප්‍රේෂණය කර තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල උපයෝජනය කර නොතිබුණි. | | |
| (ඇ) ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් ආපදා සහන සේවා කටයුතු සඳහා නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය වෙත 2016 හා 2017 වර්ෂ වලදී ලබා දී තිබු ජල ටැංකි 40 ක් හා ජල බවුසර් 02 ක් අදාල කාර්යාල වෙත ලබාදුන් බවට සනාථ කිරීම සඳහා ලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි. තවද කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදුන් ජල ටැංකියක් අස්ථාන ගත වී තිබුණි. | ජල ටැංකි ලබාදුන් කාර්යය සඳහා යොදාගෙන ලේඛන නිසිපරිදි පවත්වා ගැනීමටත් ජල ටැංකිවල ආරක්ෂාව සැලසීම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා ක්‍රියා කලයුතු විම. | අදහස් දක්වා නොමැත. |
| (ඉ) නියං ආපදා සහන සේවා කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| i. දැඩි වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා නියං සහනාධාර වැඩසටහන සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරිම සඳහා දිස්ත්‍රික්ක 14 ක ප්‍රතිලාභීන් 451,224 ක් හඳුනාගෙන තිබුණි. වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අත්තිකාරම් වශයෙන් 2018 සැප්තැම්බර් 25 දින රු.මිලියන 700 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රේෂණය කර තිබුණි. කෙසේ වෙතත් 2018 ඔක්තෝබර් 09 දින ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත එම ප්‍රතිපාදන නැවත පවරා ගැනීම සඳහා කටයුතු කර තිබුණි. අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි සහනාධාර වැඩ සටහනේ II වන අදියර 2018 සැප්තැම්බර් 20 දින සිට තුන් මසක කාලයක් සඳහා මාසිකව සහනාධාර ලබා දිය යුතු වුවද 2018 දෙසැම්බර් 31 දින වන විටත් පළමු වාරිකයට අදාල සහනාධාර | නියං සහනාධාර ලැබිය යුතු පවුල් නිශ්චය කිරීම සඳහා අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් විමර්ශන වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම මඟින් ඒ පිළිබඳ පසු පරීක්ෂාවන් සිදු කිරීමට හැකිවේ. ඒ අනුව අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කර ගැනීම මඟින් පීඩාවට පත් වූ පවුල් වලට උපරිම සහනාධාර | නියං සහනාධාර සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් සිදුකළ පැහැදිලි කිරීම් අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ නියගයෙන් පීඩාවට පත්වූ පවුල් සංඛ්‍යාව පසුකාලීනව ක්‍රමයෙන් වැඩි වී තිබුණු බවත් අදාල සහනාධාර වඩාත් ක්‍රමවත්ව බෙදාහැරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීමට සිදුවීම හේතුවෙන් ඇතැම් ප්‍රමාදයන් සිදු වී තිබුණි. |

ලබා දී අවසන්කර නොතිබුණි.

ලබාදීමට හැකි වීම.

ii. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල පරිපාලන වියදම් වෙනුවෙන් එක් මල්ලක් සඳහා රු.25 ක් ද සහනාධාර ඇසුරුම් කරන එක් පොලිසැක් බැගයක් සඳහා රු.35 ක් ද වශයෙන් අමතර එක් මල්ලක් වෙනුවෙන් රු.60 ක මුදලක් වැය කිරීමට සිදු වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල දිස්ත්‍රික් ලේකම් කාර්යාල 14 ක් සඳහා රු. 9,640,718 ක මුදලක් පරිපාලන වියදම් ලෙස ද පොලිසැක් බැග් සඳහා රු.14,495,000 ක් ද වශයෙන් එකතුව රු.24,135,718 ක් මුදලක් අනාර්ථික වියදමක් බවත් එම මුදල් සහනාධාර ලෙස ප්‍රතිලාභින්ට ලබාදීමේ හැකියාවක් පැවති බවත් අනාවරණය විය.

iii. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවි පවුල් 123,058 ක් සඳහා නියං සහනාධාර ලබා දීමට කටයුතු කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

- ගලෙන්බිඳුනුවැව සහ තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල සහනාධාර සැලසිය යුතු පවුල් පිළිවෙලින් 1050 ක් හා 1,971 ක් ලෙස හඳුනාගෙන තිබුණු නමුත් පිළිවෙළින් පවුල් 11,017 ක් හා පවුල් 11,084 ක් සඳහා සහානාධාර ගෙවා තිබුණු බව අනාවරණය විය.
- තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ග්‍රාම නිලධාරී වසම් 04 ක ප්‍රතිලාභි නාම ලේඛනය අනුමැතියකින් තොරව සංශෝධනයකර වෙනත් නම් 137 ක් ඇතුලත් කර සහනාධාර බෙදා දී තිබුණි.
- කහටගස් දිගිලිය, නොච්චියාගම, තලාව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනක අහඹු ලෙස තෝරාගත් ග්‍රාම නිලධාරී වසම් 03 ක සිදු කරන ලද විගණනයේදී විවාහක දරුවන් සමග එක් පවුල් ඒකකයක් වශයෙන් මව/පියා ජීවත් වුවද සහනාධාර ලබා ගැනීම සඳහා එම පවුල්, ඒකක දෙකක් වශයෙන් සඳහන් කර පවුල් 259 ක් සහනාධාර ලබාගෙන තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8 වන පරිච්ඡේදයේ 2 (අ) පරිදි අමාත්‍යාංශය විසින් ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම පිළියෙල කළ යුතු වේ. 2018 - 2030 දක්වා වූ කාල පරිච්ඡේදය වෙනුවෙන් නව සැලැස්මක් පිළියෙල කිරීමේ කටයුතු වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන

ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ කටයුතු අවසන් කළ යුතු වීම.

2018 -2030 දක්වා වූ කාලය සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සකස් කොට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට

| | | | |
|---|---|---|---|
| | මගින් 2017 වර්ෂයේදී රු.මිලියන 02 ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලබා දී තිබුණ ද 2018 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | | කටයුතු සූදානම් කරමින් පවතී. |
| (එ) | ජාත්‍යන්තරව පිළිගත් සෙන්දායි රාමුව අනුව ආපදා අවදානම අවම කිරීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2015 වර්ෂයේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට රු.1,300,000 ක් ලබා දී තිබුණි. එම මුදලින් 2017 දෙසැම්බර් 31 දින වන විට මධ්‍යස්ථානය විසින් රු.318,582 ක් වැය කර තිබුණද එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. උක්ත සැලැස්ම සකස් කිරීමේ කටයුතු අමාත්‍යාංශය විසින් ඉටු කළයුතු බව මධ්‍යස්ථානය විසින් ඉකුත් වර්ෂයේදී විගණනයට දන්වා තිබුණ ද අමාත්‍යාංශය විසින් ද එවැනි සැලැස්මක් පිළියෙල කිරීමට 2018 දෙසැම්බර් 31 දින වන තෙක් කටයුතු කර නොතිබුණි. | ජාත්‍යන්තරව පිළිගත් සෙන්දායි රාමුව අනුව ආපදා අවදානම අවම කිරීමේ සැලැස්ම සකස් කළ යුතු විම | මේ වන විට ජාත්‍යන්තරව ඇති කර ගත් එකඟතාවයන් අනුව අමාත්‍යාංශය විසින් අපරටට අදාල තත්ත්ව වාර්ථාව හා සූදානම් වීමේ සැලැස්ම සකස් කර එක්සත් ජාතීන්ගේ ආපදා අවම කිරීමේ සම්බන්ධීකරණ කාර්යාලය වෙත යොමුකර ඇත. මීට අමතරව ගෝලීය ඉලක්ක 7 ක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. |

## 4 තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

පහත නිරික්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතින්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාලව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී නොතිබුණි. | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතින්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය"අනුව අමාත්‍යාංශය ක්‍රියාත්මක කල යුතු විම. | අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන වල නිලධාරින් තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් හා ඒ සඳහා අවශ්‍ය දර්ශක සකස් කර ගැනීම සඳහා වන එක් වැඩමුළුවක් තිරසර සංවර්ධන ලේකම් කාර්යාලයේ සම්පත් දායකත්වයෙන් පවත් වන ලදී. සෙන්දායි රාමුව යටතේ ගෝලීය ඉලක්ක 07 කට අනුගතව ජාතික ඉලක්ක 07 ක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. |

## 5 යහපාලනය

### 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

#### 5.1.1 ආපදා සහන ගිණුම

පහත නිරික්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හදිසි ආපදා තත්වයන්ගෙන් විපතට පත් ජනතාවට සහන සැලසීම සඳහා ආධාර එකතු කිරීම අරමුණු කරගෙන විවෘත කරන ලද ගිණුමේ දේශීය හා විදේශීය පරිත්‍යාගශිලින්ගෙන් 2018 අගෝස්තු 06 දින වන විට රු.294,453,005 ක් ආධාර වශයෙන් ලැබ් තිබුණද එම අරමුදලින් පරිත්‍යාගශීලින්ගේ අරමුණු ඉටු කිරීමේ කටයුතු කර නොතිබුණි. මෙම අරමුදල තුල චින ජනරජයෙන් ලැබ් තිබුණු එක්සත් ජනපද ඩොලර් මිලියනයක්ද ඇතුලත්ව තිබුණි. | පරිත්‍යාගශීලින් ගේ අරමුණු ඉටු වන පරිදි පරිත්‍යාග මුදල් උපයෝගි කර ගත යුතු වේ. | හදිසි ආපදා තත්ත්වයන්ගෙන් විපතට පත් ජනතාවට සහන සැලයීම සඳහා පරිත්‍යාගශීලීන් විසින් මුදල් බැරකරන ලද අංක 7040171 දරන ගිණුමෙහි පැවති අරමුදල් ගංවතුර,නායයෑම් හා නායයෑම් දැඩි අවදානම හේතුවෙන් තම පදිංචි ස්ථානයෙන් ඉවත් කරන ජනතාව නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය සඳහා යොදාගැනීමට අපේක්ෂා කරන ලදි.<br>මෙම ගිණුමෙහි චීන රජයෙන් 2018 ජූලි 24 දින ලැබුණු එක්සත් ජනපද ඩොලර් මිලියන 1.00 ක මුදල ආපදා අවම කිරීමේ ව්‍යාපෘතියක් සඳහා යොදාගැනීමට උපදෙස් ලැබී ඇති අතර, ඒ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙතින් සුදුසු ව්‍යාපෘති හඳුනාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති.<br><br>ගිණුමෙහි ඉතිරි මුදල් පහත සඳහන් කාර්යන් සඳහා යොදාගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.<br>i. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ආපදා සහන සේවා නිලධාරීන්ට හා එම කොට්ඨාශවල ග්‍රාම නිලධාරී වසම් 9000ක සේවය කරන ග්‍රාම නිලධාරීවරුන් සඳහා වැහි කබායක්, බූට්ස් කට්ටලයක් හා පුනරාරෝපණය කළ හැකි විදුලි පන්දමක් බැගින් මිලදී ගෙන ලබාදීමට.<br>ii. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක සඳහා චේන්සෝ 300ක් මිලදී ගැනීමට<br>iii. අගුල් 100ක් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක සඳහා මිලදී ගැනීමට. |

## 6 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 113 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 78 ක් වුයෙන් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 35 ක් පැවතුණි. | කාර්ය මණ්ඩලය බඳවාගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු විම. | උක්ත පුරප්පාඩු අතරින් තනතුරු 17 ක් උපාධිධාරීන්, සංවර්ධන නිලධාරී තනතුරු වන අතර අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට රාජ්‍ය පරිපාලන අංශය වෙත දන්වා ඇත. මේ වන විට රියදුරු පුරප්පාඩු 02 ක් සම්පූර්ණ කර ඇති අතර කාර්යාල කාර්ය සහායකයින් 04 දෙනෙක් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයට දින නියම කර ඇත. රාජ්‍ය කළමනාකරණ සහකාර පුරප්පාඩු 03 ක්ද , සහකාර ලේකම් පුරප්පාඩු 01 ක් සඳහා අදාළ තරඟ විභාග වලින් බඳවා ගත් පසු අනුයුක්ත කිරීමට දැනුම්දී ඇත. |